# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| මගේ අංකය<br>எனது இல.<br>My No. | CSS/7/5/6/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017.07. 18 |
|---|---|---|---|---|---|

**ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 10-2017**

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

<u>ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතන වලට අනුයුක්ත කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2017 හා 2017.02.28 දිනැති ලිපිය හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

02. එම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/6/8/3 හා 2017.05.26 දිනැති ලිපිය මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

03.එමගින් ඉහත කරුණට අදාළව නිකුත් කරන ලද 2000.07.19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2000 හි පළමුවන ඡේදයේ සඳහන් සියලුම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2000 හා එයට සංශෝධන ලෙස නිකුත් කරන ලද සියලුම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2017.03.15 දින සිට අවලංගු කර ඇති අතර ඒ වෙනුවට මෙම 04/2017 චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු බව දන්වා ඇත.

04. උපාධිධාරීන් මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන යටතේ අභ්‍යාසලාභී පුහුණුවට ඇතුළත් කර නොගැනීමට සහ/හෝ කිසිම හේතුවක් මත පුහුණුවන අභ්‍යාසලාභීන් උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු පුහුණුවන්නන් ලෙස රඳවා නොගැනීමට ක්‍රියා කළ යුතුය.

05.පුහුණුව ලබන අභ්‍යාසලාභීන් සංඛ්‍යාව උපරිමය 25 ක් හෝ සමස්ත සේවක සංඛ්‍යාවෙන් 10% ක් යන දෙකින් අවම සංඛ්‍යාවට සීමා කළ යුතුය.

06.මාස 06 කට වැඩි ප්‍රායෝගික පුහුණු කාලයක් ලබාදිය යුතු පාඨමාලා ලෙස දැනට හඳුනාගෙන ඇති ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හා ඊට අනුබද්ධ කටුනායක තාක්ෂණඥයන් පුහුණු කිරීමේ ආයතනය,මොරටුව ආධුනිකත්ව පුහුණු කිරීමේ ආයතනය සහ ශ්‍රී ලංකා මෝටර් යාන්ත්‍රික ඉංජිනේරු ආයතනය යන ආයතනයන් හි තාක්ෂණික ගණයේ ප්‍රායෝගික පුහුණුවක් හැර අනිකුත් සියලුම ප්‍රායෝගික පුහුණුවීම් අනිවාර්යයෙන්ම මාස 06 කට සීමා කළ යුතු අතර,කිසිදු හේතුවක් නිසා හෝ එකී කාලසීමාව ඉක්මවා දීමනා නොගෙවිය යුතුය.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office: 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையம் / Web site: www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

# ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා අයදුම්පත්‍රය

මගේ අංකය :..................

දිනය :............................

ප්‍රධාන ලේකම්

දකුණු පළාත් සභාව.

## I කොටස

01.

01:1 කාර්යාලය : ..........................................................................................................................................

01:2 පුහුණුවට යොමු කරන ආයතනයේ නම: ...................................................................................................

01:3 යොමු අංකය හා දිනය: .................................................................................................................................

02. පුහුණුව ලබාදීමට අදහස් කරන අභ්‍යාසලාභීන් පිළිබඳ විස්තර :

| පුහුණුව ලබන්නාගේ නම (1) | විෂයය (2) | ආරම්භක දිනය (3) | අවසාන දිනය (4) | කාලය(මාස) (5) |
|---|---|---|---|---|
| I | | | | |
| II | | | | |
| III | | | | |
| IV | | | | |
| V | | | | |

03. ඉහත නම් සඳහන් ප්‍රායෝගික පුහුණුව ලබන්නන්ට ගෙවීම සඳහා ප්‍රතිපාදන ඇත/නැත.

ඉහත නම් සඳහන් පුහුණුවන්නන්ට එහි සඳහන් කාල සීමාව සඳහා ප්‍රායෝගික පුහුණුව ලබාදීම නිර්දේශ කරමි/නොකරමි.පුහුණුව ලබන දිනකට රු.500/- ක (පන්සීයයක) දීමනාවක් ලබාදිය හැක/නොහැක.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :..........................

නම :..........................................................................

තනතුර:.......................................................................

04. පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය:

නිර්දේශ කරමි/නොකරමි

..................................................

පළාත් අමාත්‍යාංශයේ ලේකම්(අත්සන හා නිල මුද්‍රව)

**II කොටස**

මගේ අංකය :..................

දිනය:............................

පළමුවන කොටසේ නම් සඳහන් පුහුණුවන්නන්ට ඊට ඉදිරියෙන් සඳහන් හයමසක (06)/අවුරුදු.......කාලය සඳහා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම අනුමත කරමි./නොකරමි.පුහුණුව ලබන එක් දිනකට රුපියල් 500/-(පන්සීයය) බැගින් ගෙවීම අනුමත කරමි./නොකරමි.

......................................................

ප්‍රධාන ලේකම්

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2017

මගේ අංකය: EST-7/ALLOW/04/2060-3
රාජ්‍ය පරිපාලන සහ
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2017.02.28

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කිරීම**

ඉහත කරුණට අදාළව නිකුත් කරන ලද 2000.07.19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2000හි පළමුවන ඡේදයේ සඳහන් සියලුම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2000 හා එයට සංශෝධන ලෙස නිකුත් කරන ලද සියලුම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2017.03.15 දින සිට අවලංගු කරන අතර ඒ වෙනුවට පහත සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය.

02. ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල සහ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පාසල්වල ක්‍රියාත්මක වන පරිගණක විද්‍යාගාර, කලාප පරිගණක සම්පත් මධ්‍යස්ථාන, පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන වැනි රාජ්‍ය පුහුණු ආයතනවල පාඨමාලා හදාරා සුදුසුකම් ලත් සිසු සිසුවියන් හා විශ්ව විද්‍යාලවල උපාධි පාඨමාලා හදාරන දෙවන, තුන්වන හා හතරවන වසරවල උපාධි අපේක්ෂක/අපේක්ෂිකාවන් වෙනුවෙන් ප්‍රායෝගික පුහුණුව ලබාගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අනුමත කිරීමේ බලය සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට, පළාත් ප්‍රධාන ලේකම්වරුන්ට හා දිස්ත්‍රික් ලේකම්වරුන්ට පවරනු ලැබේ.

03. උපාධිධාරීන් මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන යටතේ අභ්‍යාසලාභී පුහුණුවට ඇතුළත් කර නොගැනීමට සහ/හෝ කිසිම හේතුවක් මත පුහුණුවන අභ්‍යාසලාභීන් උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු පුහුණුවන්නන් ලෙස රඳවා නොගැනීමට ක්‍රියා කළ යුතුය.

04. පුහුණුව ලබන අභ්‍යාසලාභීන් සංඛ්‍යාව උපරිමය 25ක් හෝ සමස්ත සේවක සංඛ්‍යාවෙන් 10%ක් යන දෙකින් අවම සංඛ්‍යාවට සීමා කළ යුතුය.

05. ඒ අනුව ප්‍රායෝගික පුහුණුව ලබාදීමට අදහස් කරන සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් මෙයට අමුණා ඇති ආකෘති පත්‍රය අනුව සකස්කර පිටපත් 02කින් යුක්තව සම්පූර්ණ කොට දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සමඟ අදාළ බලධරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

06. මෙහි 08 ඡේදය යටතේ දක්වා ඇති තාක්ෂණික ගණයේ ප්‍රායෝගික පුහුණුවක් හැර අනිකුත් සියලුම ප්‍රායෝගික පුහුණුවීම් අනිවාර්යයෙන්ම මාස 06කට සීමා කළ යුතු අතර, කිසිදු හේතුවක් නිසා හෝ එකී කාලසීමාව ඉක්මවා දීමනා නොගෙවිය යුතුය.

07. අවශ්‍ය ප්‍රතිපාදන සැලසී ඇත්තේ නම් පමණක් පුහුණුලාභියෙකුට දෛනිකව රු.500/-ක දීමනාවක් ගෙවිය හැකි අතර, ඊට අමතරව වෙනත් කිසිදු දීමනාවක් හෝ පාරිශ්‍රමිකයක් නොගෙවිය යුතුය. එමෙන්ම මෙම දීමනා ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයේ අතිරේක මුදල් ප්‍රතිපාදන නොඉල්ලීමට ආයතන ප්‍රධානීන් වගබලා ගතයුතුය.

08. මාස 06කට වැඩි ප්‍රායෝගික පුහුණු කාලයක් ලබාදිය යුතු පාඨමාලා ලෙස දැනට හඳුනාගෙන ඇත්තේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හා ඊට අනුබද්ධ කටුනායක තාක්ෂණඥයන් පුහුණු කිරීමේ ආයතනය, මොරටුව ආධුනික පුහුණු කිරීමේ ආයතනය සහ ශ්‍රී ලංකා මෝටර් යාන්ත්‍රික ඉංජිනේරු ආයතනය යන ආයතනයන්හි පවත්වාගෙන යන තාක්ෂණික පාඨමාලාවන් පමණකි. එම පුහුණුව ද පාඨමාලාවේ නිර්දේශිත ප්‍රායෝගික පුහුණු කාලසීමාව නොඉක්මවිය යුතුය.

09. පුහුණුවන්නන් පුහුණුව සඳහා ආයතනයකට අනුයුක්ත කිරීමේ දී ඔවුනට ආයතනයේ කිසියම් තනතුරක වගකීම් නොපැවරිය යුතුය.

10. ප්‍රායෝගික පුහුණුව ලබන්නන්ට රජයේ ස්ථිර හෝ ස්ථිර නොවන සේවකයින් සඳහා හිමි කිසිදු වරප්‍රසාදයක් හිමි නොවන බව පැහැදිලිවම ලිඛිතව දැනුම් දිය යුතුය. තවද ප්‍රායෝගික පුහුණුව සඳහා ආවරණ අනුමතිය ලබා දීමක් ද නොකළ යුතුය.

11. මෙම පුහුණු ලබාදීම සම්බන්ධයෙන් අදාළ ආයතන හෝ පුහුණුව ලබන්නා සමඟ කිසිදු ගිවිසුමකට ඇතුළත් නොවිය යුතුය.

12. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය

07. ඒ අනුව ප්‍රායෝගික පුහුණුව ලබාදීමට අදහස් කරන සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් මෙයට අමුණා ඇති ආකෘති පත්‍රය අනුව සකස්කර පිටපත් 02කින් යුක්තව සම්පූර්ණ කොට දෙපාර්තමේන්තු ප්‍රධානීගේ හා පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සමඟ ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

08.අවශ්‍ය ප්‍රතිපාදන සැලසී ඇත්තේ නම් පමණක් පුහුණුලාභියෙකුට දෛනිකව රු.500/- ක දීමනාවක් ගෙවිය හැකි අතර,ඊට අමතරව වෙනත් කිසිදු දීමනාවක් හෝ පාරිශ්‍රමිකයක් නොගෙවිය යුතුය.එමෙන්ම මෙම දීමනා ගෙවීම සඳහා පළාත් භාණ්ඩාගාරයෙන් අතිරේක මුදල් ප්‍රතිපාදන නොඉල්ලීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතුය.

09. පුහුණුවන්නන් පුහුණුව සඳහා ආයතනයකට අනුයුක්ත කිරීමේ දී ඔවුනට ආයතනයේ කිසියම් තනතුරක වගකීම් නොපැවරිය යුතු අතර රජයේ ස්ථිර හෝ ස්ථිර නොවන සේවකයින් සඳහා හිමි කිසිදු වරප්‍රසාදයක් හිමි නොවන බව පැහැදිලිවම ලිඛිතව දැනුම් දිය යුතුය.තවද ප්‍රායෝගික පුහුණුව සඳහා ආවරණ අනුමතිය ලබා දීමක් ද නොකළ යුතුය. මෙම පුහුණු ලබාදීම සම්බන්ධයෙන් අදාළ ආයතන හෝ පුහුණුව ලබන්නා සමඟ කිසිදු ගිවිසුමකට ඇතුළත් නොවිය යුතුය

10. මෙම චක්‍රලේඛ උපදෙස් පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලු ආයතන දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්:01.සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02.නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) : දැ.ගැ.ස.
03. නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු) : අ.ක.ස.
04. අයවැය අධ්‍යක්ෂ, දකුණු පළාත : අ.ක.ස.
05.ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ, දකුණු පළාත : අ.ක.ස.
06. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ ,දකුණු පළාත : දැ.ගැ.ස.